

ධර්මය යනු

දරන ස්වභාවයයි

නිරුක්ති යනු

උක්තයෙන් නිර්ණය වන අදහසයි
(සිවුපිළිසිඹියාපත් ඥාණ වලින් එකකි)

හේතු ඵල යනු


ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ,
අමෝහ යන හේතු හයෙන්
ගොඩනැගෙන ප්‍රථිඵලයි

යථාබෝධය ලබා ගැනීමට නම්

ධර්මයට බහා බැලිය යුතුයි විනයට
සසඳා බැලිය යුතුයි

චතුරාර්ය සත්‍ය

- දුක
- දුකට හේතුව
- දුක නැති කිරීම
- දුක නැති කිරීමේ මාර්ගය


බුද්ධ දේශනාව
මහත් ඵල
දස සංයෝජන ප්‍රහාණය
දුක
දුකට හේතුව
දුක නැති කිරීම
දුක නැති කිරීමේ මාර්ගය
සෝවාන්
සකදාගාමී
අනාගාමී
අරිහත්
සක්කාය දිට්ඨි
විචිකිච්චා
සීලබ්බත පරාමාස
කාමරාග
පටිඝ
රූප රාග
අරූප රාග
මාන
උද්දච්ච
අවිද්‍යා

සෝතාපන්න වන්නේ බණ ඇසීමෙනි

බණ අසා සෝවාන් වූ බවට ත්‍රිපිටක සාක්ෂි

ත්‍රිපිටක ග්‍රන්ථය	පිටුව	ශ්‍රාවකයාගේ නම
මහාවග්ගපාලි 1	25	කොණ්ඩඤ්ඤ
මහාවග්ගපාලි 1	27	වප්ප, භද්දිය, මහානාම, අස්සජී
මහාවග්ගපාලි 1	33	යසකුලපුත්
මහාවග්ගපාලි 1	35	යසකුලපුත්ගේ මව
මහාවග්ගපාලි 1	39	යසකුලපුත්ගේ බිරිඳ
මහාවග්ගපාලි 1	39, 41	විමල , සුබාහු, පුණ්ණජී, ගවම්පති, යසගේ යලුවෝ, යසගේ යහලු නෑ පිරිස 50 දෙනා
මහාවග්ගපාලි 1	49, 51	උරුවෙල් දනව්වේ භද්‍රවර්ගිකයෝ 30 දෙනා සහ ඉබ්රියන්
මහාවග්ගපාලි 1	77	බිම්බිසාර රජ හා පිරිස
මහාවග්ගපාලි 1	85	ශාරිපුත්‍ර පරිබ්‍රාජක
මහාවග්ගපාලි 1	87	මුගලන් පරිබ්‍රාජක
අංගුත්තර නිකාය -5	73	සීහ සේනාපති
මජ්ජිම නිකාය -2	73	උපාලි ගහපති
මජ්ජිම නිකාය -3	573	500 මෙහෙණන්

බන ඇසීමෙන් ප්‍රථම
සංයෝජන ධර්ම තුන
පූර්ණ වශයෙන්ම
ප්‍රහීණ වේ

සතර සෝතාපත්ති අංග

- කල්‍යාන මිත්‍ර සම්පත්තිය
- සද්ධර්ම ශ්‍රවණය
- යෝනිසෝමනසිකාරය
- ධම්මානුධම්ම පටිපදාව

3773. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "සාරිපුත්ත, සෝවාන් අඟ සෝවාන් අඟැයි මෙය කියනු ලැබේ. සාරිපුත්ත, සෝවාන් අඟ කවරේ දැ"යි. වහන්ස, සත්පුරිස් සෙවුම සෝවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකි"යි. සාරිපුත්ත, මැනවි, මැනවි. සාරිපුත්ත, සත්පුරිස් සෙවුම සෝවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකි.

සෝවාන් ඵලයට පත්වීම සිදු වන්නේ බන ඇසීමෙනි

එනම්

මෙනෙහි කල යුතු සහ මෙනෙහි නොකල යුතු ධර්මයන් පිළිබඳව ඇතිවන අවබෝධයයි

එසේනම් මෙනෙහි කල යුත්තේ කුමක් ද ?

අනිච්ච යනු

ලෝකයේ දරණ ස්වභාවයයි

ප්‍රකෘතියයි

පරම සත්‍යයයි

එසේනම් මෙනෙහි
කල යුත්තේ
අනිච්ච දුක්ඛ අනත්ත
ස්වභාවයයි



තථාගත සාසනයේ ප්‍රධානතම ඉගැන්වීම

අස්සාද

ආදීනව

නිස්සරණය

බුදු පියාණන් වහන්සේ බුද්ධත්වය සඳහා කල පර්යේෂනය

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ ශ්‍රමණ

කෙනෙකු වීම සඳහා

දැනගත යුතු දහම් කරුණු

අස්සාද ආදීනව නිස්සරණ

සෝතාපන්න වීම සඳහා

දැනගත යුතු දහම් කරුණු

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ බ්‍රහ්ම චරියාව සඳහා දැනගත යුතු දහම් කරුණු

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ

සමථ - විපස්සනා යනු

කුමක්ද ?

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ

විද්‍යාව යනු කුමක්ද ?

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ

අස්සාසය සහ

පරමස්සාසය

යනු කුමක්ද ?

අස්සාද ආදීනව නිස්සරණ

තථාගත සාසනයේ ප්‍රධානතම ඉගැන්වීම

අස්සාද

ආදීනව

නිස්සරණය

අස්සාදය පිළිබඳව

අවබෝධයක් ඇත්තේ

ආර්ය ශ්‍රාවකයන්ට

පමණක් වේ

චරිත ලක්ෂණ අනුව

දේශනාව වෙනස්වන බවට

ත්‍රිපිටක සාක්ෂි

චරිත ලක්ෂණ අනුව දේශනාව වෙනස් වන බව

උද්ඝටිතඥ			නිස්සරණය	නිවන් දැකීමට වාසනා ඇති ත්‍රිහේතුකයින්
විපඤ්චිතඥ		ආදීනව	නිස්සරණය	
නෙය්‍යපුග්ගල	අස්සාද	ආදීනව	නිස්සරණය	
පද පරම	පද වල ව්‍යාකරණ රීති හා පද පමනක් තේරේ. අර්ථ නොතේරෙන භාෂා විශාරදයින් වැනි අයයි. ඔවුන්ට අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන නුවන පහල නොවේ. බස පමනක් අමුනාගත් අර්ථයෙන් බහ අමුණා බමුණා යන නාමය පටබැදේ. ඔවුන්ට ධර්මය දේශනා කල යුත්තේ ලෞකික සුගති මගයි			මෙම අත්බැව්හි නිවන් දැකීමට වාසනා නැති අහේතුක සහ ත්‍රිහේතුක අය

අපේ සැබෑ ඉච්ඡත්වය කුමක්ද ?

ඇස

කන

නාසය

දිව

ශරීරය

මන

පිනවීම

හෙවත්

ආස්සාදය



සැප වේදනාව

සහ

අස්සාදය

යනු එකක් නොවේ

විපාක දුක් වේදනාව හෝ
සැප වේදනාව
ප්‍රහාණය කල නොහැක

9. කතමාචානන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු සබ්බසඞ්ඛාරෙහි අට්ටීයති හරායති ජිගුච්ඡති. අයං වුච්චතානන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා.





ආදීනවය

ආදී + නවය

ආදී + නවය = ආදීනවය

<u>රහත් ඵලය දක්වා අස්සාද නිර්මාණය කල ආදියේ නවය</u>

1 අවිජ්ජා 2 තණ්හා 3 ලෝභ 4 ද්වේෂ 5 මෝහ 6 සුභසඤ්ඤා 7 සුඛසඤ්ඤා 8 නිච්චසඤ්ඤා 9 අත්තසඤ්ඤා

<u>නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය</u>

1 සමථ 2 විපස්සනා 3 අලෝභ 4 අද්වේෂ 5 අමෝහ 6 අසුභසඤ්ඤා 7 දුක්ඛසඤ්ඤා 8 අනිච්චසඤ්ඤා 9 අනත්තසඤ්ඤා


සංඛාරයෙන්
→
චේතනා
රාග සංඛාරයෙන්
ද්වේෂ සංඛාරයෙන්
මෝහ සංඛාරයෙන්
→
රාගචේතනා
ද්වේෂචේතනා
මෝහචේතනා
රාග
ද්වේෂ
මෝහ
→
රාගචේතනා
ද්වේෂචේතනා
මෝහචේතනා
රාග
ද්වේෂ
මෝහ
→
සං + චේතනා
අභිසංඛාරයෙන්
→
සංචේතනා

සංඛාර


යනු පදාර්ථ ලෝකයේ දෙයක් නොව

සිතේ හටගන්නා

සංචේතනායි



ආර්ය සාසනයේ
පංචකාම ගුණ
උපදීහු හෙවත්
ආස්වාදනීය ධර්ම



ජාති ධර්ම
ජරා ධර්ම
ව්‍යාධි ධර්ම
මරණ ධර්ම
ශෝක ධර්ම
පරිදේව ධර්ම
දුක්ඛ ධර්ම
දෝමනස්ස ධර්ම
උපායාස ධර්ම

ජාති යනු උපතද ඇතුලු
භෞතික ලෝකයේ ඇති සියල්ල අයිති වේ.

සතර මහා භූත ලෝකය = ද්‍රව්‍ය / පුද්ගල

ජාති හා පටිච්ඡ වීමෙන් ප්‍රිය ජාති හෙවත්
ජාතිපි දුක නැමැති ආස්සාදය හට ගනී.

උපාදානස්කන්ධ ලෝකය = වස්තු / සත්ව

අධ්‍යාත්මික ෂඩායතන යනු සතර මහා භූතයන්ගෙන් සෑදුණු ඇස කන ආදී ඉන්ද්‍රියන්ද ?

අභ්‍යන්තර ආයතන	පෙනෙන ස්වභාවය	ගැටෙන ස්වභාවය	බාහිර ආයතන	පෙනෙන ස්වභාවය	ගැටෙන ස්වභාවය
ඇස	අනිදස්සන	සප්පටිඝ	රූප	සනිදස්සන	සප්පටිඝ
කන	අනිදස්සන	සප්පටිඝ	ශබ්ද	අනිදස්සන	සප්පටිඝ
නාසය	අනිදස්සන	සප්පටිඝ	ගන්ධ	අනිදස්සන	සප්පටිඝ
දිව	අනිදස්සන	සප්පටිඝ	රස	අනිදස්සන	සප්පටිඝ
කය	අනිදස්සන	සප්පටිඝ	පොට්ඨබ්බ	අනිදස්සන	සප්පටිඝ
මන	අනිදස්සන	අප්පටිඝ	ධම්ම	අනිදස්සන	අප්පටිඝ



සතර මහා
භූතයන්ගෙන් සැදුණු
ඉන්ද්‍රියන් අයත්
වන්නේ බාහිර
රූපායතනයටය

අධ්‍යාත්මික ෂඩායතන යනු සතර මහා භූතයන්ගෙන් සැදුණු ලෝකය සමග්‍ර පටිච්ච වී අභ්‍යන්තරයේ උදා කරගන්නා නිරෝධ කල හැකි ආයතන හය හෙවත් ආශ්වාද කයකි


“මම” යනු ඇස, කන, නාසය, දිව, කය, සහ මන යන ඉන්ද්‍රියන්ගේ අධිවේගී ක්‍රියාකාරිත්වයෙන් ගොඩනඟා ගන්නා;

- ❖ පංච උපාදානස්කන්ධය
- ❖ අභ්‍යන්තර ෂඩායතන
- ❖ දුක්ඛ ආර්ය සත්‍ය
- ❖ ලෝකය

හෙවත් නිරෝධ කළ හැකි ආශ්වාද කයයි




පංචස්කන්ධය



අනිච්ඡ දුක්ඛ අනත්ථ

පංච උපාදානස්කන්දය



අනිච්ඡානුපස්සනා

දුක්ඛානුපස්සනා

අනත්ථානුපස්සනා

ලෙස ගත යුතු වේ

ආර්යයන්ගේ

අවබෝධය

පටිච්චසමුප්පාදයයි

පටිච්ඡසමුප්පාදයේ නිතර යෙදෙන තාක්ෂණික වචන

1 අවිද්‍යා
2 සංකාර
3 විඤ්ඤාණ
4 නාමරූප
5 සළායතන
6 ඵස්ස
7 වේදනා
8 තණ්හා
9 උපාදාන
10 භව
11 ජාති
12 ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස

අභිසංකාර පටිච්චසමුප්පාදය

අවිද්‍යාව

අභිසංකාර

අභිවිඤ්ඤාණ

අභිනාමරූප

සළායතන

සංඵස්ස

සංඵස්සජා වේදනා


තණ්හා

උපාදන

භව

චක්ඛු	සෝත	ඝාන	ජිව්හා	කාය	මන
චක්ඛු සංකාර	සෝත සංකාර	ඝාන සංකාර	ජිව්හා සංකාර	කාය සංකාර	මනෝ සංකාර
චක්ඛු විඤ්ඤාණ	සෝත විඤ්ඤාණ	ඝාන විඤ්ඤාණ	ජිව්හාවිඤ්ඤාණ	කාය විඤ්ඤාණ	මනෝ විඤ්ඤාණ
නාම රූප	නාම රූප	නාම රූප	නාම රූප	නාම රූප	නාම රූප
චක්ඛායතන	සෝත ායතන	ඝානායතන	ජිව්හායතන	කායායතන	මනායතන
ඵස්ස	ඵස්ස	ඵස්ස	ඵස්ස	ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා	වේදනා	වේදනා	වේදනා	වේදනා
තණ්හා	තණ්හා	තණ්හා	තණ්හා	තණ්හා	තණ්හා
උපාදන	උපාදන	උපාදන	උපාදන	උපාදන	උපාදන
භව	භව	භව	භව	භව	භව

ඉදප්පච්චයතා
පටිච්චසමුප්පාදය



පටිච්ච
සමුප්පාදය
අකුසල මූල
කුසල මූල
අව්‍යාකෘත
ලෝභ
පටිඝ
උද්දච්ච
විචිකිච්ඡා
ලෞකික
ලෝකෝත්තර
කුසල විපාක
අකුසල විපාක
කිරියා

ලෝභ පටිච්චසමුප්පාදය

අකුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෝභ
අවිද්‍යා
සංකාර
විඤ්ඤාණ
නාමරූප
සළායතන
ඵස්ස
වේදනා
තණ්හා
උපාදාන
භව

ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති

පටිඝ

පටිච්චසමුප්පාදය

අකුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෝභ	පටිඝ
අවිද්‍යා	අවිද්‍යා
සංකාර	සංකාර
විඤ්ඤාණ	විඤ්ඤාණ
නාමරූප	නාමරූප
සළායතන	සළායතන
ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා
තණ්හා	පටිඝ
උපාදාන	අධිමොක්ඛ
භව	භව

ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති

විචිකිච්ඡා

පටිච්චසමුප්පාදය

අකුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෝභ	පටිඝ	විචිකිච්ඡා
අවිද්‍යා	අවිද්‍යා	අවිද්‍යා
සංකාර	සංකාර	සංකාර
විඤ්ඤාණ	විඤ්ඤාණ	විඤ්ඤාණ
නාමරූප	නාමරූප	නාමරූප
සළායතන	සළායතන	සළායතන
ඵස්ස	ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා	වේදනා
තණ්හා	පටිඝ	විචිකිච්ඡා
උපාදාන	අධිමොක්ඛ	-
භව	භව	භව
ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති		

උද්ධච්ච

පටිච්චසමුප්පාදය

අකුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෝභ	පටිඝ	විචිකිච්ඡා	උද්ධච්ච
අවිද්‍යා	අවිද්‍යා	අවිද්‍යා	අවිද්‍යා
සංකාර	සංකාර	සංකාර	සංකාර
විඥ්ඥාණ	විඥ්ඥාණ	විඥ්ඥාණ	විඥ්ඥාණ
නාමරූප	නාමරූප	නාමරූප	නාමරූප
සළායතන	සළායතන	සළායතන	සළායතන
ඵස්ස	ඵස්ස	ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා	වේදනා	වේදනා
තණ්හා	පටිඝ	විචිකිච්ඡා	උද්ධච්ච
උපාදාන	අධිමොක්ඛ	-	අධිමොක්ඛ
භව	භව	භව	භව
ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති			

පටිච්චසමුප්පාදය යනු සත්ව

උප්පත්තියේ යාන්ත්‍රණයක්

පමණක් නොව කෙලෙස්

සදන යාන්ත්‍රණයකි

විපාක

පටිච්චසමුප්පාදය

කාමාවචර කුසල විපාක

	ආරම්මණය	විපාක පංච විඤ්ඤාණ	විපාක මනෝ ධාතු	විපාක මනෝ විඤ්ඤාණ ධාතු
කාමාවචර කුසල විපාක	රූපාරම්මණ	උපේක්ෂා -චක්ඛු විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	සද්දාරම්මණ	උපේක්ෂා -සෝත විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	ගන්ධාරම්මණ	උපේක්ෂා -ඝාන විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	රසාරම්මණ	උපේක්ෂා -ජිව්හා විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	පොට්ඨබ්බාරම්මණ	සුඛ -කාය විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	ධම්මාරම්මණ	-	-	සෝමනස්ස/උපේක්ෂා
අකුසල විපාක	රූපාරම්මණ			
	සද්දාරම්මණ			
	ගන්ධාරම්මණ			
	රසාරම්මණ			
	පොට්ඨබ්බාරම්මණ			
	ධම්මාරම්මණ			

කාමාවචර අකුසල විපාක

	ආරම්මණය	විපාක පංච විඤ්ඤාණ	විපාක මනෝ ධාතු	විපාක මනෝ විඤ්ඤාණ ධාතු
කාමාවචර කුසල විපාක	රූපාරම්මණ	උපේක්ෂා -චක්ඛු විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	සද්දාරම්මණ	උපේක්ෂා -සෝත විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	ගන්ධාරම්මණ	උපේක්ෂා -ඝාන විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	රසාරම්මණ	උපේක්ෂා -ජිව්හා විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	පොට්ඨබ්බාරම්මණ	සුඛ -කාය විඤ්ඤාණ	උපේක්ෂා	සෝමනස්ස/උපේක්ෂා
	ධම්මාරම්මණ	-	-	සෝමනස්ස/උපේක්ෂා
අකුසල විපාක	රූපාරම්මණ	උපේක්ෂා -චක්ඛු විඤ්ඤාණ	උපේක්ෂා	උපේක්ෂා
	සද්දාරම්මණ	උපේක්ෂා -සෝත විඤ්ඤාණ	උපේක්ෂා	උපේක්ෂා
	ගන්ධාරම්මණ	උපේක්ෂා -ඝාන විඤ්ඤාණ	උපේක්ෂා	උපේක්ෂා
	රසාරම්මණ	උපේක්ෂා -ජිව්හා විඤ්ඤාණ	උපේක්ෂා	උපේක්ෂා
	පොට්ඨබ්බාරම්මණ	දුක්ඛ -කාය විඤ්ඤාණ	උපේක්ෂා	උපේක්ෂා
	ධම්මාරම්මණ	-	-	උපේක්ෂා

විපාක පටිච්චසමුප්පාද චක්‍ර

-
සංකාර
විඤ්ඤාණ
නාම
ෂට්ඨායතන
ඵස්ස
වේදනා
-
-
භව

ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති

කුසල මූල

පටිච්චසමුප්පාදය

ලෞකික කුසල මූල පටිච්චසමුප්පාදය

කුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෞකික
කුසල මූල
සංකාර
විඤ්ඤාණ
නාම
ෂට්ඨායතන
ඵස්ස
වේදනා
පසාද
අධිමොක්ඛ
භව

ජාති ජරා මරණ ...
දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති

ලෝකෝත්තර
කුසල මූල
පටිච්චසමුප්පාදය

කුසල මූල පටිච්චසමුප්පාද චක්‍ර

ලෞකික	ලෝකෝත්තර
කුසල මූල	කුසල මූල
සංකාර	සංකාර
විඤ්ඤාණ	විඤ්ඤාණ
නාම	නාම
ඡට්ඨායතන	ඡට්ඨායතන
ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා
පසාද	පසාද
අධිමොක්ඛ	අධිමොක්ඛ
භව	භව
ජාති ජරා මරණ ... දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති	ජාති ජරා මරණ ... <u>ධම්මානං</u> සමුදයෝ හෝති

පටිච්ච සමුප්පාදය නිරෝධය

විපාක	අභිසංකාර	ලෞකික කුසල මූල	ලෝකෝත්තර කුසල මූල
–	අවිද්‍යා	කුසල මූල	කුසල මූල
සංකාර	සංකාර	සංකාර	සංකාර
විඥාණ	විඥාණ	විඥාණ	විඥාණ
නාම	නාම රූප	නාම	නාම
ෂඩායතනය	සළායතන	ෂඩායතනය	ෂඩායතනය
ඵස්ස	ඵස්ස	ඵස්ස	ඵස්ස
වේදනා	වේදනා	වේදනා	වේදනා
–	තණ්හා	පසාද	පසාද
–	උපාදාන	අධිමොක්ඛ	අධිමොක්ඛ
භව	භව	භව	භව
දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති	දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති	දුක්ඛස්කන්ධස්ස සමුදයෝ හෝති	ධම්මානං සමුදයෝ හෝති

දුක්ඛ නිරෝධ මාර්ගය

දුක්ඛ නිරෝධ මාර්ගය යනු

පටිච්චසමුප්පාද නිරෝධයි

හෙවත් ලෝකෝත්තර

අරිඅටඟි මඟයි



අරි අටඟි මග

අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ

ආර්ය අෂ්ඨාංගික මාර්ගය

සම්මා දිට්ඨිය සියල්ලටම පූර්වාංගම වේ

දස වස්තුක මිත්‍යා දෘෂ්ටිකයා නිවන් නොලබයි

දිට්ඨි සම්පන්න ආර්ය ශ්‍රාවකයා ගෙවා හල දුක් ප්‍රමාණය මහ පොළොව වැනිය

මිථ්‍යා දිට්ඨිය මහ පොළව
තරම් කෙලෙස් සාදයි

සම්මා දිට්ඨිකයා
ඉන්ද්‍රකීලයක් සේ
නොසැළෙයි

ලෝකෝත්තර සම්මා දිට්ඨිය

ධර්මාවබෝධයෙන් පත්වන
ලෝකෝත්තර සම්මා
දිට්ඨිය යනු අස්සාදයෙහි
නොබැඳිය යුතුයි යන
දෘෂ්ඨියයි

සම්මා යනු අභිසංකාර නිරෝධයයි

සම්මා දිට්ඨිය යනු
අස්සාදය නිරෝධ කළ
යුතුයි යන ඥාණයයි

සම්මා ප්‍රතිපදාව යනු
අස්සාද නිරෝධයයි

සම්මා දිට්ඨියට දැකිය යුත්තේ අනිච්ච වේ

සම්මා දිට්ඨියෙන් පංච
උපාදානස්කන්ධය හෙවත්
අස්සාදය නිරෝධ වේ

සම්මා යන්නට නිරැක්තිය

සං + මා


මීඳීමට බැඳෙනව

ආර්ය ශ්‍රාවකයාගේ සම්මා

දිට්ඨි සම්මා වායාම සම්මා

සති යන අංග තුන අනෙකුත්

අංග වටා පරිවාර වේ


සම්මා
දිට්ඨි
සම්මා
සංකප්ප
සම්මා
ආජීව
සම්මා
වාචා
සම්මා
කම්මන්ත
සම්මා
වායාම
සම්මා
සති



තථාගත පිරිනිමීමෙන් පසු සාසනයේ ගුරුවරයා කවුරුද ?

සාසනයේ

ගුරුවරයා

ධර්මයයි

දස්සනේන පහාතබ්බයේදී
දේශකයාගෙන් හෙවත්
කලණ මිතුරාගෙන්
අසා දැනගත යුතුදෑ ?

ධර්ම දේශනාව

ආස්වාදය, ආදීනවය,

නිස්සරණය

ගැන විය යුතුය

ප්‍රඥාවේ අවස්ථා තුනකි

- ❖ සුතමය,
- ❖ චින්තාමය
- ❖ භාවනාමය

භාවනා
කල යුත්තේ
කුමක්ද ?

භාවනා කල යුත්තේ
අරි අටගි මගයි

භාවනාව
යනු කුමක්ද ?

භාවනාව යනු
නීවරණ ප්‍රහානයයි

සම්මා සමාධිය යනු කුමක්ද ?

ආර්ය සාසනයේ භාවනාවේදී පලමු, දෙවන, තුන්වන, සිවුවන ධ්‍යාන වඩා සම්මා සමාධිය පූර්ණය කරන අතර මෙය දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය නම් වේ

ධ්‍යාන සමවැදීමට
සතර ඉරියව්වම
යොදාගත හැක

රාග ද්වේශ මෝහ
අභිසංකාර හෙවත් කර්ම
අස්ථාන ගත කිරීම
කර්මස්ථානයි

ධ්‍යානයේ සිට මෙනෙහි කල යුත්තේ කුමක්ද?

ධ්‍යානයේ සිට
මෙනෙහි කල යුත්තේ
අනිච්ච ස්වභාවයයි

සත්තිස් බෝධිපාක්ෂික
ධර්ම සමාන ලක්ෂණ
නිසා එකක් වඩන විට
අනෙක් සියල්ල වැඩේ

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම

1. සතර සතිපට්ඨානය	- 4
2. සතර සම්පක්ප්‍රධාන	- 4
3. සතර ඍද්ධිපාද	- 4
4. පංච ඉන්ද්‍රිය	- 5
5. පංච බල	- 5
6. සප්ත බොජ්ඣංග	- 7
7. ආර්ය අෂ්ඨාංගික මග	- 8
	37

ආස්වාදයේ ආදීනව දැක නිස්සරනය වඩන විට බෝධිපාක්ෂික ධර්ම වැඩී නිවන් මග පූර්ණ වේ

සියලු ධ්‍යාන
ආර්ය ධ්‍යාන
නොවේ

ආර්‍ය ධ්‍යාන
සාසන මගයි

ආර්ය ධ්‍යාන වලට පමණක් විශේෂිත වූ ලක්ෂණ

- විවේක නිශ්‍රිත
- විරාග නිශ්‍රිත
- නිරෝධ නිශ්‍රිත
- වොස්සග්ග පරිණාමී

ආර්ය දැහැන්
වැඩීමේදී
කාමයෙන් වෙන්ව
අකුසලයෙන් වෙන්වීම
අනිවාර්යවේ

ධ්‍යාන වැඩීමට දැනගත යුතු දේ

ධ්‍යාන වැඩීමට
දැනගත යුත්තේ
කාමයේ ආදීනව
හෙවත් පංච නීවරණ
නිරෝධ මගයි

විතක්ක විචාර සහ සවිතක්ක සවිචාර අතර වෙනස

විතක්ක යනු කාම සංකල්පනා, ව්‍යාපාද සංකල්පනා, හිංසා සංකල්පනායි

විචාර යනු එහි සිත හැසිරවීමයි

සවිතක්ක යනු නෙක්කම්ම සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනායි

සවිචාර යනු එහි සිත හැසිරවීමය

එනම් සවිතක්ක සවිචාර කිරීම යනු **අනිච්ඡානුපස්සී විහරති** වීමයි

ධ්‍යානාංග අතර සම්බන්ධය

ප්‍රථම ධ්‍යානය	සවිතක්ක (විතක්ක)	සවිචාර (විචාර)	ප්‍රීති	සුඛ	ඒකාග්‍රතා
ද්විතීක ධ්‍යානය	සවිතක්ක (අවිතක්ක)	සවිචාර (අවිචාර)	ප්‍රීති	සුඛ	ඒකාග්‍රතා
තෘතීක ධ්‍යානය	සවිතක්ක (අවිතක්ක)	සවිචාර (අවිචාර)	ප්‍රීති නිරෝධයි	සුඛ	ඒකාග්‍රතා
චතුර්ත ධ්‍යානය	සවිතක්ක (අවිතක්ක)	සවිචාර (අවිචාර)	ප්‍රීති නිරෝධයි	සුඛ නිරෝධය	උපේක්ෂා ඒකාග්‍රතා




බමුණන්ගේ ඉන්ද්‍රිය භාවනාව ලෞකිකය
ආර්යන්ගේ අනුත්තර ඉන්ද්‍රිය භාවනාව නිවන් මගකි

ආර්ය අට්ඨික සංඥාව වැඩීම යනු සතර ධ්‍යාන වැඩීම හෙවත් සම්මා සමාධියයි

අර්ථික සංඥාව අනිවාර්ය ලෙස

ගිරිමානන්ද සූත්‍රය

අට්ඨීයති



ආර්යයන්
සත්තිස් බෝධිපාක්ෂික ධර්ම
අට්ඨික සංඥාව ලෙස ගනී
එනම් ආස්වාදය ඇට වැනි වූ
සංකල්පිත රාගයක් බවයි

බමුණන් ඇට අට්ඨික සංඥාව ලෙස
ගනී

චතුරාරක්ඛා භාවනා

බුද්ධානුස්සති

මෙත්තානුස්සති

අසුභානුස්සති

මරණානුස්සති

බුද්ධානුස්සති

සීමා නොකර අප්‍රමාණ වූ බුදු ගුණ වඩමු

නිවැරදි ලෙස බුදු ගුණ සජ්ඣායනා කිරීමෙන් උපක්‍රමයක් ලෙස ගති හඩ වැඩී ගති ගුණ ගති රුව විද්‍යාමාන වේ.

මෙත්තානුස්සති

ආර්ය මෛත්‍රී භාවනාව

සෝවාන් ඵලයෙන්

නිදුක් වෙත්වා

සකදාගාමී ඵලයෙන්

නිරෝගී වෙත්වා

අනාගාමී ඵලයෙන්

සුවපත් වෙත්වා

අරිහත් ඵලයෙන්

දුකින් මිදෙත්වා

නිවන් දකිත්වා...

අසුභානුස්සති

අසුභානුපස්සනාව යනු සබ්බ සංඛාර නිරෝධ මගයි

මරණානුස්සති

ආර්ය මරණ සතිය
අකුසල නිරෝධ මගකි

බමුණු මරණ සතිය
භය උපදන අකුසල මගකි



ආනාපාන සති භාවනා දෙකක් ඇත

ධ්‍යාන කිරීමට මනසිකාර කල යුත්තේ ලෝකයට අයත් නොවන ආරම්මනයක් වන දුටු නිවනයි

මනසිකාර කල යුත්තේ
මුඛ නිමිත්ත හෙවත්
දුටු නිවන වේ

වායුව සමකොට බවුන් වඩන

ආනාපාන සතිය ආර්ය වේ

වායුව මෙනෙහි කොට බවුන්

වැඩීම අනාර්ය වේ

සිත පිරිසිදු කර නිවන් දැකීම
හෙවත් අනුන්ටත් තමන්ටත්
අවැඩක් නොවන ලෙස සිතුවිලි
ක්‍රියා වදන් මෙහෙය වීම යනු

ලෝකෝත්තර ධ්‍යාන

වැඩීමයි

ආනාපානසති භාවනාව යනු ආස්සාදයේ ආදීනවය අස්සාස හෙවත් ඇසුරු කර ඡන්දරාග නිස්සරණය හෙවත් පස්සාස කිරීමයි

නිවන් මග පූර්ණ කිරීමට කල යුත්තේ නිර්මිත සංකල්පිත කාමය හෙවත් අස්සාදයේ ආදීනවය දැක චන්දරාග නිරෝධය කිරීමට අනිච්ච දුක්ඛ අනත්ථ වැඩීමයි


නිමාව